# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel:** 11 4062180-190, 011 2565304, **Fax:** 011 4714460, 0114503001.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org


**ජනාධිපතිවරණය 2015,**

**මාධ්‍ය නිවේදනය 4**

**2014-12-27 වන දින කොළඹ - ශ්‍රී ලංකාව.**

**කළුතර දිස්ත්‍රික්කය බේරුවල - විපක්ෂයේ දේශපාලන ක්‍රියාකාරීන්ට එරෙහි ප්‍රහාරයක්**

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිරීක්ෂක වාර්තා කළ පරිදි විපක්ෂයේ දේශපාලන පක්ෂ කිහිපයක එකතුවෙන් බේරුවල දී පැවැති ප්‍රචාරක රැලියක් අවසන ඊට සහභාගී වූවන්ට එරෙහිව ගල් මුල් ප්‍රහාරයක් එල්ල වී ඇත. එම පෙරමුණේ ප්‍රකාශකයෙක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට පැවසූ පරිදි අදාළ ප්‍රචාරක රැස්වීම 2014 දෙසැම්බර් 26 වැනි දින ප.ව. 9.30ට පමණ අවසන් කර චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනාධිපතිනිය හා බස්නාහිර පළාත් සභා මන්ත්‍රිනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය ඇතුලු තවත් පිරිසක් බේරුවල පීනවල පාරේ පිහිටි බස්නාහිර පළාත් සභා මන්ත්‍රී මොහොමඩ් ජෙමින් මරික්කාර් මොහොමඩ් ඉස්තිකාර්ගේ නිවසේ රාත්‍රී ආහාරය ගැනීම සඳහා පිටත්ව ගොස් ඇත. ඔවුන් එහි රාත්‍රී ආහාරය ගන්නා අතරතුර එ.ජ.නි.ස.ට අයත් ප්‍රාදේශීය දේශපාලනඥයෙකුගේ මැදිහත්වීමෙන් ඒකරාශී වූ පිරිසක් ඉස්තිකාර් මහතාගේ නිවසට ගල් මුල් ප්‍රහාරයක් එල්ල කර ඇත. තවදුරටත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත වාර්තා වූයේ මෙම ගැටුම ක්‍රමයෙන් උත්සන්න වීමත් සමග දෙපාර්ශවයම එකිනෙකා හට ගල්මුල් ප්‍රහාර එල්ල කර ගත් බවයි. මෙම ප්‍රහාරය නිසා බේරුවල නගර සභා හිටපු විපක්ෂ නායක මොහමඩ් මන්සූර් දල්හාර් තුවාල ලබා බේරුවල මූලික රෝහලට ගෙන ගොස් ඇති අතර ඔහුට ප්‍රතිකාර ලබා දීම රෝහලෙන් ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවද විශේෂ කාර්ය බළකාය සහ බේරුවල පොලිසිය පිරිස විසුරුවා හැරීමට සමත් වි ඇත.

බේරුවල රෝහලේ බාහිර රෝගි අංශය වෛද්‍ය සමරසිංහ මහත්මිය ප්‍රකාශ කලේ කිසිඳු තුවාල කරුවෙකු රෝහලට බාර නොගන්නා ලෙසට බේරුවල පොලිසිය විසින් දැනුම් දි ඇති බවයි. මොහමඩ් ජෙමින් මහතා ප්‍රකාශ කළේ ආරම්භයේ පටන්ම බේරුවල පොලිසියේ ස්ථානාධිපති දුමින්ද රාජපක්ෂ මහතා හිටපු ජනාධිපතිනි බණ්ඩාරනායක මහත්මියට ආරක්ෂාව දීම ප්‍රතික්ෂප කළ බවයි මේ පිළිබඳව මැ.ප්‍ර.නි.ම ස්ථානාධිපතිවරයාගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කළේ පොලිස් නිළධාරීන් 40 ක ආරක්ෂාවක් ලබා දුන් බවයි.

සිද්ධිය පිළිබඳව වැඩිදුරටත් කරුණු දැක්වූ බස්නාහිර පළාත් සභා මන්ත්‍රිනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය ප්‍රකාශ කරන ලද්දේ තමන් හා හිටපු ජනාධිපතිනිය වටකරගත් එ.ජ.නි.ස. ආධාරකරුවන් විශාල පිරිසක් තමන් හට අවමන් කරමින් ගල් මුල් ප්‍රහාර එල්ල කරන අවස්ථාවේ දී බේරුවල පොලීසියේ නිලධාරීන් සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් කිසිවෙකු එය මැඩ පැවැත්වීමට කිසිඳු උත්සාහයක් නොගත් බවයි.

මීට පෙර ද බේරුවල ආසනයෙන් මෙවැනි ආකාරයේ බරපතළ සිදුවීම් කිහිපයක් වාර්තා වුවත් බේරුවල පොලීසිය සැකකරුවන් නීතියේ රැහැනට හසු කර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගත් බවට විවිධ චෝදනා එල්ල වූ අතර විපක්ෂයේ ක්‍රියාකාරීන් හට මෙසේ අඛණ්ඩව ප්‍රහාර එල්ල වීම වැළැක්වීම සඳහා පොලීසිය වහා නිසි පියවර ගත යුතු ව ඇත.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.



ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු